දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. PSC/APL/10/96/2025

ඔබේ අංකය / உமது இல. / Your No. MDM/AD/05/MET/TRANSFERS

දිනය / திகதி / Date 2026.03. 17

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

**<u>2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

**<u>කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන ඔබගේ සමාංක හා 2025.12.17 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත සඳහන් සේවාවේ නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එක් අභියාචනයක් පමණක් ඉදිරිපත් වී තිබූ අතර එම අභියාචනයට අදාළ එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණය මේ සමඟ ඔබ වෙත එවමි.

03) මෙම නිලධාරිනිය සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ඇය වෙත දන්වා යැවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) අදාළ නිලධාරිනිය රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත් වන්නේනම් 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05) එසේම කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක සේවයේ 2026 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන ඉල්ලීම් හා ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Nday

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>පිටපත</u>

01. අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - කරු/ දැ.ගැ.ස.

# කාලගුණ විද්‍යා නිරීක්ෂක / සන්නිවේදක - වාර්ෂික ස්ථාන මාරු

## 2026

| අනු අංකය | නම | සේවා විස්තර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද සේවා ස්ථානය | රා.සේ.කො. තීරණය |
|---|---|---|---|---|---|
| 01 | කේ.ජී.එන්. දුලාංජලී මහත්මිය | කාලගුණ විද්‍යා නිරීක්ෂක/ සන්නිවේදක | වවුනියාව කාලගුණ විද්‍යා කාර්යාලය | ලබා දී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කර ඇත |

03/17